
# Geography

# භූගෝල විද්‍යාව

11
Grade












වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කුරුණෑගල

# සිතියම්

## තේමා සිතියම්

එක් සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇත.

- දේශගුණික සිතියම්
- වෘක්ෂලතා සිතියම්
- භූ විෂමතා සිතියම්
- මාර්ග ව්‍යාප්ති සිතියම්
- ජන ව්‍යාප්ති සිතියම්

## භූ ලක්ෂණ සිතියම්

භූමිය මත දැක්වෙන භෞතික හා සංස්කෘතික ලක්ෂණ පැතලි තලයක් මත පරිමාණුකූලව ඉදිරිපත් කිරීමයි.


### භෞතික ලක්ෂණ

- භූවිෂමතාව
- ජලවහනය
- ස්වභාවික වෘක්ෂලතා
- වෙරළ ලක්ෂණ

### සංස්කෘතික ලක්ෂණ

- මාර්ග රටා
- ජනාවාස
- කෘෂි භෝග
- නගර
- පරිපාලන මායිම්


## භූ ලක්ෂණ සිතියම්




7.6 සිතියම
ශ්‍රී ලංකාවේ 1:50 000 සිතියම් සඳහා
පදනම් කරගත් ජාල රටාව (Grid system)

ශ්‍රී ලංකාවේ පිදුරුතලාගල (උසම කඳු මුදුන) කඳු මුදුනේ සිට 200km බටහිරට ගොස් එතැන් සිට දකුණු දශාවට අඳින ලද සිරස් රේඛාව ද 200km දකුණට ගොස් එතැන් සිට බටහිරට අඳින සිරස් රේඛාව ද හමුවන ස්ථානය ශ්‍රී ලංකාවේ මෙට්‍රික් සිතියම් නිර්මාණයට පදනම ලෙස සකස් කර තිබේ. මෙය පදනම් මූලය වේ.

මෙහි දැක්වෙන පදනම්මූලයේ සිට කිලෝ මීටර් 25න් 25ට උතුරට ද 40න් 40ට නැගෙනහිරට ද කොටු 92ක් සකස් කර ඇත. එම කොටු 1.1 සිතියමේ දක්වා ඇත. එම සිතියම් 92 න් සෑම සිතියමකටම කිලෝමීටර් 5 න් 5ට (සෙ.මී. 10න් 10ට) ජාතික මෙට්‍රික් ඛණ්ඩාංක ලකුණු කර ඇත. එම රේඛා කැපෙන ස්ථාන සිතියම තුල නිල් පාටින් ඇඳ ඇත.




## සිතියම්වල අන්තර්ගත තොරතුරු

**1:50 000 භූ ලක්ෂණ සිතියම**


- **මුහුණත තොරතුරු**
  - **භෞතික ලක්ෂණ**
    - භූ රූප (land forms)
    - ගංගා (rivers)
    - වනාන්තර (forests)
    - තණබිම් (grasslands)
    - ලඳුකැලෑ (scrub forest)
    - පාෂාණ උද්ගත (rock outcrop) ආදිය
  - **සංස්කෘතික ලක්ෂණ**
    - පරිපාලන මායිම්
    - මාර්ග
    - ජනාවාස
    - වගාබිම්
    - රජයේ ගොඩනැගිලි
    - ආදිය
- **පර්යන්ත තොරතුරු**
  - **වටතීරුවේ ඉහළ කොටස**
    - A. සිතියම් වර්ගය
    - B. සිතියමේ නම
    - C. සිතියම් අංකය
  - **වටතීරුවේ පහළ කොටස**
    - පරිමාණය
    - දිශාව
    - යාබද සිතියම් දක්වන සටහන
    - පරිපාලන මායිම් දක්වන සටහන
    - සූචකය

භූමියේ සෙ.මී. 50000ක් සිතියම්වල සෙ.මී. එකකින් පෙන්වන නිසා එම සිතියම් 1:50000 සිතියම් ලෙස නම් කර ඇත.

**සිතියමේ 1cm = භූමියේ 50,000 cm**


එනම් භූමියේ මතුපිට කිලෝ මීටර් 1කක දුර දැක්වෙනුයේ සිතියමේ සෙ.මී. දෙකකිනි.

## 1:50 000 භූ ලක්ෂණ සිතියමක ආකෘතිය




## සිතියම්වල දැක්වෙන පර්යන්ත තොරතුරු


**1. දිශාව**




සැබෑ උතුර - True North (TN)


චුම්බක උතුර - Magnetic North (MG)

ජාල උතුර - Grid North (GN)




**2. පරිමාණය**

රේඛීය පරිමාණය




නියෝජ්‍ය පරිමාණ භාගය - 1:50000

## 3. සූචකය

### සම්මත සලකුණු




ශ්‍රී ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙනි


## සිතියම් කොටසක වර්ග ඵලය සෙවීම.


1:50000

1cm : 50000 cm


2cm : 100000(ලක්ෂයට)cm

මේ අනුව සෑම දුරක්ම සිතියමේ සෙ.මී. 2 කින් භූමියේ කිලෝ මීටර් 1ක් දැක්වේ.









1. දිග 6cm ක් වන සිතියමේ පිහිටි මාර්ගයක දිග ඉහත පරිමාණයට අනුව කි.මී. කීයද?
2. දිග 8cm ක් හා පළල 6 cm ක් වූ සිතියමේ සැබෑ බිමේ වර්ගඵලය කි.මී. කීයද?





1. 25km ක් වන භූවිෂමතා සිතියමක් නිර්මාණය කරන්නේ කෙසේද?






කඳු වැටිය සහ හරස්කඩ





නිම්නය සහ හරස්කඩ





නෙරුව සහ හරස්කඩ





නිම්නය හා නෙරුව





කොත් කන්ද




හුදකලා කන්ද




මඳ බෑවුම සහ දළ බෑවුම





භූ විෂමතා ලක්ෂණ දැක්වෙන සිතියමක්.





කඳු වැටියක ත්‍රිකෝණමිතික ස්ථානය දැක්වීම.

**අභ්‍යාසය 01**





වරහන් තුළ දී ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.

1. A-B රේඛාව,
   (නිම්නය / නෙරුව / කපොල්ල)
2. C- D රේඛාව
   (නිම්නය / නෙරුව / කපොල්ල)
3. E වලින් දැක්වෙන්නේ,
   (කඳු වැටිය / කොත් කන්ද / තැන්න)
4. G-H රේඛාව,
   (මඳ බෑවුම / දළ බෑවුම / උත්තල බෑවුම)
5. I - J රේඛාව (දළ බෑවුම / මඳ බෑවුම)
6. F වලින් දැක්වෙන සංකේතය
   (තැන්උස / ත්‍රිකෝණමිතික ස්ථානය / කඳු බෑවුම)





1. උසින් 200m ට වැඩි ප්‍රදේශ දුඹුරු පාටින් සේයා කරන්න.
2. *A-B, C-D* මඟින් පෙන්නුම් කරන භූ ලක්ෂණ එම ස්ථානයේ ලියා දක්වන්න.
3. 140m සමෝච්ච රේඛාව අඩක් ඇඳ තිබේ. එය සම්පූර්ණ කර ඇඳ දක්වන්න.
4. ගංගාව දෙපස වී වගා බිම් දක්වන්න
5. නැගෙනහිර මායිමට ආසන්න ව පොල් වත්තක් සහ කුඩා ගෙවතු බිම් දෙකක් අඳින්න.

## සිතියම් ප්‍රදේශයක මායිම් හඳුනා ගැනීම.








තැනිතලාව සහ තැන් උස





රැළි බිම හා කඳු වැටිය





උත්තල බෑවුම සහ අවතල බෑවුම





මොහොර බෑවුම





සානුව





අනාගාමී නිම්න සහ තිර්යයක් නිම්න




ජල කපොල්ල / සුළං කපොල්ල




අරීය
ශාඛීය
ජාලාකාර
උ
300
ජලවහන රටා
වලයාකාර





1. ගංමෝය
2. ඩෙල්ටාව
3. අප ශාඛා
4. ගං දඟර
5. හැඩපළු ලක්ෂණ
6. වගුරු බිම්
7. දුණුවිල


**මෙම භූලක්ෂණ නම් කරන්න. පහත දැක්වෙන සටහනින් තෝරා යටින් ලියන්න.**




.............................................. .............................................. .............................................. ..............................................





.............................................. .............................................. .............................................. ..............................................





.............................................. .............................................. .............................................. ..............................................

**කඳු වැටිය / සානුව / මුහුද / කපොල්ල / අපශාඛා / දළ බෑවුම / කෙත් කන්ද / ආයතගාමී නිම්නය**
**උත්තල බෑවුම / හැඩපළු ගංගාව / වැලි පරය / හෙල්මලු / වලයාකාර ජලවහනය**



උ
1100
1200
1200
1200

කොත් කන්ද
කපොල්ල
ගෙල කපොල්ල
අසමමිතික බෑවුම
500
600
882
87
71

# අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නැංවීමේ ව්‍යාපෘතිය

## භූගෝල විද්‍යාව

1. සිතියම් ප්‍රදේශයේ අංක 1 සිට 6 දක්වා පවතින ලක්ෂණ නම් කරන්න.
2. මෙහි පවතින මාර්ග රේඛීය ස්වභාවයක් නොගැනීමට හේතු දක්වන්න.
3. කොත්මලේ ජලාශය පටු දිගටි හැඩයක් ගැනීමට හේතු දෙකක් ලියන්න.
4. සිතියමට පහළින් ඇති දිශා සටහනේ පවතින දිශා තුනක් නම් කරන්න.
5. මෙම භූමි ප්‍රදේශයේ තේ වගාව බහුල වීමට හේතු දෙකක් දක්වන්න.
6. ජලාශය අවට පවතින වෘක්ෂලතා හෝ වගාබිම් නම් කරන්න.
7. මෙහි වී වගාව සිදුකර ඇති ආකාරය පිළිබඳ අදහස් දෙකක් දක්වන්න.
8. මෙහි ජලවහන රටාව කුමක් විය හැකිද?
9. වෘත්තාකාර ප්‍රදේශයේ පවතින සංස්කෘතික ලක්ෂණ පහක් දක්වන්න.
10. ප්‍රධාන ගංගාව ගලන දිශාව දක්වන්න.
11. මේවායින් උසින් වැඩි කොටස තෝරා ලියන්න.
    (උතුරු කොටස, දකුණු කොටස, මධ්‍ය කොටස)
12. ජලාශය පිහිටා ඇති උස දක්වන්න.




1:50000


TN
MN GN

# <u>අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නැංවීමේ ව්‍යාපෘතිය</u>


## භූගෝල විද්‍යාව

1. නැගෙනහිර අර්ධයේ වර්ගඵලය ගණනය කරන්න.
2. මෙම සිතියමට අදාළ රේඛීය පරිමාණය දක්වන්න.
3. ගංගාව ආශ්‍රිත පවතින මායිම දක්වන්න.
4. වැව නිර්මාණය කිරීමට බලපෑ භෞතික සාධක දෙකක් ලියන්න.
5. ඊසාන දිග උස්බිම් කොටසේ පවතින භූ ලක්ෂණ තුනක් දක්වන්න.
6. මෙහි ගංගාව ගලන්නේ කුමන දිශාවට දැයි දක්වන්න.
7. සොරබොර වැවෙහි අක්‍රමවත් හැඩයට හේතු දෙකක් දක්වන්න.
8. ප්‍රධාන මංසන්ධි ජනාවාසයෙහි පවතින රාජ්‍ය ආයතන තුනක් සඳහන් කරන්න.
9. නැගෙනහිර අර්ධයේ වී වගාව අවම වීමට හේතු හතරක් ලියන්න.
10. බටහිර අර්ධයේ තද දුඹුරු වර්ණයෙන් දැක්වෙන රේඛාව කුමක්ද?
11. ගංගාව පළලින් වැඩිවීමට හේතු දෙකක් ලියන්න.
12. AB හා CD රේඛාවලින් දැක්වෙන බෑවුම් නම් කරන්න.
13. A සිට B දක්වා ඇති ඊසාන නිරිත දිශාගත රේඛාව ඔස්සේ හරස්කඩ නිර්මාණය කරන්න.
14. වැව් ව්‍යාප්ත වී ඇති උස (ආසන්න සමෝච්ඡ රේඛාව) දක්වන්න.
15. මෙහි ජලවහන රටාව කුමක්ද? ඊට හේතු දෙකක් දක්වන්න.
16. X, Y හා Z ස්ථානවල පවතින ලක්ෂණ තුන දක්වන්න.

# ශ්‍රී ලංකා 1:50 000
# අංක 55 මහියංගන සිතියමෙන් කොටසක්




AB - හරස් පැතිකඩ




සිරස් පරිමාණය - 1 : 30 000

# <u>අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නැංවීමේ ව්‍යාපෘතිය</u>

## භූගෝල විද්‍යාව

1. මොණරාගල නගරය ආශ්‍රිත කොටුවේ වර්ගඵලය ගණනය කරන්න.
2. එම චතුරශ්‍රයෙහි පවතින සංස්කෘතික ලක්ෂණ හතරක් දක්වන්න.
3. A-B හා E - F බෑවුම් වර්ග නම් කරන්න.
4. CD රේඛාවෙන් දැක්වෙන්නේ කුමක්ද?
5. ප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර්වලින් සොයන්න.
6. මෙහි පවතින මායිම් රේඛාව නම් කර ඊට පදනම් වූ භෞතික සාධකය දක්වන්න.
7. ප්‍රධාන මාර්ගය සෘජු බවක් නොගැනීමට හේතු තුනක් දක්වන්න.
8. සිතියමේ මධ්‍ය ප්‍රදේශයේ වගා බිම් අඩු වීමට හේතු දෙකක් දක්වන්න.
9. වනාන්තර බිම් සුරක්ෂිත වීම මෙම ප්‍රදේශයේ අඩු වුවහොත් ඇතිවන ගැටලු දෙකක් ලියන්න.
10. මෙම ප්‍රදේශයේ පවතින ජනාවාස වර්ග දෙකක් දක්වන්න.
11. මෙම සිතියම් ප්‍රදේශයට අදාල වන රේඛීය පරිමාව ඇඳ දක්වන්න.
12. වාරි ඇල, තැනිතලා බිම, වෙනත් වගාවන් දැක්වෙන්නේ කුමන අක්ෂර වලින් දැයි දක්වන්න.




SCALE 1:50000

# අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නැංවීමේ ව්‍යාපෘතිය

## භූගෝල විද්‍යාව

1. සිතියම් ප්‍රදේශයේ වර්ගඵලය සොයන්න.
2. දකුණු හා නැගෙනහිර කොටස්වල වී වගාව අඩුවීමට හේතු තුනක් දක්වන්න.
3. E-Fදක්වා පවතින පරිපාලන මායිම දක්වන්න.
4. X-Yදක්වා මාර්ගයේ දිග කිලෝමීටර්වලින් දක්වන්න.
5. C, D හා H වලින් දක්වා ඇති ලක්ෂණ මොනවාද?
6. මෙහි පවතින වගාවන් තුනක් දක්වන්න.
7. මෙය ජාලාකාර ජලවහනයකින් යුතු ප්‍රදේශයකි. ඊට හේතු තුනක් දක්වන්න.
8. ගංගාවේ සිග්සැග් හැඩයට හේතු දෙකක් ලියන්න.
9. ප්‍රදේශයේ උසම ස්ථානයේ ඇති උස දක්වන්න.
10. මෙහි කඳුවැටිවල පවතින බෑවුම් බොහොමයක් උත්තල බෑවුම් වේ. ඊට හේතු දක්වන්න.
11. සිතියම් ගත ප්‍රදේශයේ ඇති ප්‍රධාන වෙළඳ බෝගය නම් කර එය බහුලව ව්‍යාප්ත වීමට හේතු දෙකක් දක්වන්න.
12. මෙහි ප්‍රධාන ජල මාර්ගවලට සමාන්තරව ප්‍රධාන මාර්ග විහිදී ඇති බැව් පෙනේ. ඊට හේතු දෙකක් දක්වන්න.





SCALE 1:50000

# අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නැංවීමේ ව්‍යාපෘතිය

## භූගෝල විද්‍යාව

1. අංක 1 සිට 5 දක්වා පවතින ලක්ෂණ නම් කරන්න.
2. සිතියමේ ඇති චතුරශ්‍රයෙහි වර්ගඵලය ගණනය කරන්න.
3. ප්‍රධාන ගංගාව ආශ්‍රිත භෞතික ලක්ෂණ තුනක් දක්වන්න.
4. මෙම ප්‍රදේශයේ වැව් බහුලවීමට හේතු දෙකක් දක්වන්න.
5. මෙම ප්‍රදේශය තැනිතලා බිමක් බව දැක්වීමට හේතු දෙකක් ලියන්න.
6. මෙහි ඇති පරිපාලන මායිම් වර්ග දෙකක් ලියන්න.
7. ප්‍රදේශයේ පුරාම පොල් වගාව පැතිරීමට හේතු දෙකක් ලියන්න.
8. වයඹ මුහුදු ප්‍රදේශයේ දක්නට ඇති නිල් පැහැති රේඛාව නම් කරන්න.
9. සිතියම් ප්‍රදේශයේ පවතින භෞතික ලක්ෂණ පහක් දක්වන්න.
10. කුඹුරු සඳහා ජලය සපයන මාර්ග දෙකක් ලියන්න.
11. දුම්රිය මාර්ගයේ දිග කිලෝමීටර්වලින් දක්වන්න.
12. දුම්රිය මාර්ගය ඔස්සේ ගමන් කරන්නෙකුට හමුවන පාලම් ගණන කීයද?
13. ප්‍රදේශයේ ඍජු රටාවකට මාර්ග නිර්මාණය වීමට හේතු දෙකක් දක්වන්න.
14. මෙහි වෙරළ ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය සඳහා කළ හැකි සංවර්ධන යෝජනා ක්‍රම තුනක් දක්වන්න.
15. සිතියම් ප්‍රදේශයේ ඇති සම්පත් ආශ්‍රිතව ජනතාවට කළ හැකි රැකියා පහක් නම් කරන්න.



Sidalapitiya
5 FATHOMS
Chilaw Town
Chilaw Lake
Timilla Kulam
Munnessaram Wewa
Munnessarama
Nallan Wewa
Karawita Wewa
Ambakandavila
Kakkapalliya
Ponnankanniya
Walahena
Mardankulama
Indigasdawela
Pambala
Karukkuwa
Sembukattiya
Uraliya
Tambagalla
Nariyagama
PITIGAL KORALE NORTH (CHILAW)
A
B
C
D
1
2
3
4
5


1:50000




TN
MN
GN

# අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නැංවීමේ ව්‍යාපෘතිය

## භූගෝල විද්‍යාව

1. මෙම සිතියම් ප්‍රදේශයේ පවතින පළාත් දෙක හා දිස්ත්‍රික්ක දෙක නම් කරන්න.
2. මෙහි ජනාවාස අඩුවීමට හේතු තුනක් ලියන්න.
3. මෙම ප්‍රදේශයේ පවතින ජලවහන රටාව කුමක්ද?
4. ගංගාව ආශ්‍රිත පවතින විශේෂ භෞතික ලක්ෂණ තුනක් දක්වන්න.
5. ගිණිකොන කොටසේ නටඹුන් වැව් බහුල වීමට හේතු දෙකක් දක්වන්න.
6. කොස්ගම ප්‍රදේශයේ පවතින භූමි ලක්ෂණ පිළිබඳව ඔබට කුමක් කිව හැකිද?
7. මීටර් 600 වඩා උස් ප්‍රදේශ දෙකක් නම් කරන්න.
8. මෙම භූමි ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග නොමැතිවීමට හේතු දෙකක් ලියන්න.
9. ප්‍රදේශයේ බෑවුම කවර දිශාවටදැයි දක්වන්න.
10. AB හා CD බෑවුම් නම් කරන්න.
11. අංක 1,2 හා 3 යන ස්ථානවල පවතින භෞතික ලක්ෂණ මේවායින් තෝරා ලියන්න. (තැනිතලාව, රැළිබිම, සානුව, කඳුවැටිය, හෙල් බෑම්ම, කොත් කන්ද)
12. ප්‍රදේශයේ උසම ස්ථානය පවතින්නේ කවර චතුර්ථ භාගයේදැයි දක්වන්න.

# SRI LANKA 1:50,000 - SHEET No. 76 - HAPUTALE (PART OF)



# අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නැංවීමේ ව්‍යාපෘතිය

## භූගෝල විද්‍යාව

1. වර්ගඵලය ගණනය කරන්න.

$$\text{දිග Km x පළල Km} = \frac{\text{දිග cm}}{2} \times \frac{\text{පළල cm}}{2}$$

2. මෙහි පවතින වගාවන් තුනක් දක්වන්න.
3. ගංගාව ආශ්‍රිත කැපී පෙනෙන භෞතික ලක්ෂණ තුනක් දක්වන්න.
4. ගංගාව ඔස්සේ ඇති පරිපාලන මායිම් දක්වන්න.
5. ඉදිකළ ප්‍රදේශය බිහිවීමට හේතු තුනක් දක්වන්න.
6. වෙරළට සමාන්තරව ඇති මාර්ගයේ දුර කීයද? සරැලි දර්ශකය ගණනය කරන්න. (ඍජු දුර හා වක්‍ර දුර අතර වෙනස)
7. ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගංගාව ගලන දිශාව දක්වන්න.
8. උතුරු කඳු වැටියේ පවතින භූ ලක්ෂණ පහක් දක්වන්න.
9. මෙහි පවතින මාර්ග වර්ග හතරක් ඇඳ පෙන්වන්න.
10. වී වගාව කෙරෙහි බලපා ඇති භෞතික සාධක දෙකක් දක්වන්න.
11. වැලිගම නගරයේ ඇති රජයේ සේවා ස්ථාන තුනක් දක්වන්න.
12. කඳු වැටියේ පවතින වෘක්ෂලතා වර්ග දෙකක් දක්වන්න.
13. දකුණු ප්‍රදේශය සංචාරක කර්මාන්ත සඳහා යොදාගත හැකි බවට සාධක හතරක් දක්වන්න.
14. ප්‍රදේශයේ මාර්ග ඍජු රටාවකට විහිදී නොමැත. ඊට හේතු තුනක් ලියන්න.


# SRI LANKA 1:50,000 SHEET No. 91 - MATARA (PART OF)




ආසියා මහද්වීපය



යුරෝපා මහද්වීපය




## අප්‍රිකා මහද්වීපය



# උතුරු ඇමෙරිකා මහද්වීපය



# දකුණු ඇමෙරිකා මහද්වීපය



**ඕස්ට්‍රේලියා මහද්වීපය**



## ඔබට සපයා ඇති මහාද්වීප සිතියම්වල පහත සඳහන් දෑ ලකුණු කරන්න.

**ආසියා මහද්වීපය -** ඩෙකෑන් සානුව, සුමාත්‍රා, ජාවා දූපත්, චීනය, ජපානය, දකුණු කොරියාව, ආරාබි මුහුද, බෙංගාල බොක්ක, හිමාලය වැටිය, කැස්පියන් මුහුද, බයිකල් විල, ඒරල් මුහුද, පර්සියන් බොක්ක, හොවැංහෝ ගඟ, මලක්කා සමුද්‍ර සන්ධිය, මැලේ දීමාව, තායිලන්තය, පිලිපීනය, මැනිලා, කහ මුහුද, බංගලා දේශය, පාකිස්ථානය, තාර් කාන්තාරය, ගෝබි කාන්තාරය, පාමීර් සානුව, මොංගෝලියාව, ස්ටෙප්ස් තෘණ බිම්, රුසියාව.

**යුරෝපා මහද්වීපය -** කළු මුහුද, බ්‍රිතාන්‍ය දූපත්, ඉංග්‍රීසි ඕඩය, නෝර්වේ, ස්වීඩන්, පෘතුගාලය, නෙදර්ලන්තය, අයිස්ලන්තය, ඉතාලිය, ග්‍රීසිය, කොන්තන්තිනෝපල්, මොස්කව්, ඩෙන්මාර්කය, උතුරු මුහුද, බිස්කේ බොක්ක, රයින් ගඟ, රෝන් ගඟ, සේන් ගඟ, ඇල්ප්ස් කඳු, පින්ලන්තය.

**අප්‍රිකා මහද්වීපය -** නයිල් ගඟ, වික්ටෝරියා විල, රතු මුහුද, මධ්‍යධරණී මුහුද, කොංගෝ ගඟ, නයිජර් ගඟ, මැඩගස්කරය, සෝමාලියාව, ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය, සූවස් ඇල, ඊජිප්තුව, මොසැම්බික් ඕඩය, කේප් තුඩුව, කලහාරී කාන්තාරය, සහරා කාන්තාරය, මොරොක්කෝව, වෙල්ඩ් තෘණ බිම, කොංගෝ වනාන්තරය.

**උතුරු ඇමෙරිකා මහද්වීපය -** කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ඇලස්කාව, රොකී කඳු, පැනමා ඇල, කියුබාව, පංච මහා විල්, ශාන්ත ලෝරන්ස් ගංගාව, බීරිං සමුද්‍ර සන්ධිය, මෙක්සිකෝ බොක්ක, කැලිපෝර්නියාව, හඩ්සන් බොක්ක, ලැබ්‍රදෝර් අර්ධද්වීපය, ග්‍රීන්ලන්තය, ප්‍රෙයරීත් තණ බිම, මිසිසිපි ගඟ, කොලරාඩෝ ගංගාව.

**දකුණු ඇමෙරිකා මහද්වීපය -** ඇමේෂන් ගඟ, මැගලන් සමුද්‍ර සන්ධිය, ඇන්ඩීස් වැටිය, ඇටකාමා කාන්තාරය, පැටගෝනියා කාන්තාරය, පරානා පැරගුවේ ගංගාව, ටිටිකාකා විල, චිලී, වෙනිසියුලාව, ක්විටෝ, බ්‍රසීලය, ඇමේෂන් වනය, පැම්පාස් තෘණ බිම.

**ඕස්ට්‍රේලියා මහද්වීපය -** මහා බාධක කඳු, මරේඩාලිං ගඟ, නවසීලන්තය, තස්මේනියාව, මහා වික්ටෝරියා කාන්තාරය, කාපන්ටේරියා බොක්ක, නුලාබාර් තැන්න, එයර් විල, ඇඩිලේඩ් - ඩාවින් දුම්රිය මාර්ගය, මහා බාධක පරය, බාස් සමුද්‍ර සන්ධිය, කුක් සමුද්‍රසන්ධිය, ක්වීන්ස්ලන්තය, සිඩ්නි ඩවුන්ස් තෘණ බිම.

## ලංකා සිතියමේ ලකුණු කර දක්වන්න.

1. වී පර්යේෂණාගාර දක්වන්න.

   බතලගොඩ, මහඉලුප්පල්ලම, ගන්නොරුව, බෝඹුවල, අම්බලන්ගොඩ

2. තලවාකැලේ පර්යේෂණාගාරය, අගලවත්ත රබර් පර්යේෂණාගාරය, ලුණුවිල පොල් පර්යේෂණාගාරය

3. සුළු පොල් ත්‍රිකෝණය (රත්න, මිද්දෙණිය, තංගල්ල).

4. ශ්‍රී ලංකාවේ පහත සඳහන් කර්මාන්ත හා අනෙකුත් දෑ පිහිටි ස්ථාන ලකුණු කරන්න.

| | |
|---|---|
| 1. රසායන ද්‍රව්‍ය කර්මාන්තශාලාව | 2. තුනී ලෑලි කර්මාන්තශාලාව, |
| 3. සීනි කර්මාන්තශාලාව | 4. ටයර් කර්මාන්ශාලාව |
| 5. මිරිදිය ධීවර මධ්‍යස්ථාන | 6. මොරගහකන්ද ජලාශය |

5. කෙලවරපිටිය තාප විදුලි බලාගාරය, ආරුගම්බොක්ක, බූන්දල වනෝද්‍යානය

